ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරණය

අවසාන පරීක්ෂණය - 2007/2008

මූලික සංඛ්‍යානය හා ආර්ථික විද්‍යාව - MCC 1103

කාලය පැය දෙකයි (02)

---

දිනය : 2008.01.20 වේලාව : පෙ.ව. 10.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා

---

පොදු උපදෙස් :

1. A කොටසෙන් ප්‍රශ්න 2 කටත් B කොටසෙන් ප්‍රශ්න 2 කටත් පිළිතුරු සපයන්න.
2. එක් කොටසකට පැය බැගින් කාලය වෙන් කරන්නේ නම් මැනවි.
3. එක් එක් කොටසට වෙන් වෙන්ව පිළිතුරු සපයා වෙන් වෙන්ව අමුණා භාර දෙන්න.
4. ප්‍රස්ථාර කොළ සපයනු ලැබේ.
5. වැඩ සටහන් ගත කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතා කළ හැකිය.
6. සියළුම ප්‍රශ්නවලට සමාන ලකුණු ලැබේ.

## A කොටස - ආර්ථික විද්‍යාව

1. (අ) පහත සඳහන් ආර්ථික ක්‍රම ඇති රටවල්, මූලික සූක්ෂම ආර්ථික විද්‍යා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්නේ කෙසේද?

i විවෘත/ලිහිල් ආර්ථික ක්‍රමයක්

ii මිශ්‍ර ආර්ථික ක්‍රමයක් (ලකුණු 10)

(ආ) i නිෂ්පාදන හැකියා වක්‍ර විග්‍රහය සම්බන්ධව ඇති උපකල්පන මොනවාද?

ii රටක නිෂ්පාදන හැකියා වක්‍රය විතැන්වීමට බලපාන සාධක කවරේද?

iii රටක්, එහි ඇති සම්පත් උපයෝගී කරගෙන ප්‍රාග්ධන භාණ්ඩවලට සාපේක්ෂව වැඩිපුර පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනයෙහි යෙදිතියැයි උපකල්පනය කරන්න. මෙම තත්ත්වය එම රටෙහි ආර්ථික වර්ධනයට බලපාන්නේ කෙසේද?

(ලකුණු 5x3 = 15)

OPEN UNIVERSITY OF SRI LANKA LIBRARY

2. (අ) භාණ්ඩ හුවමාරු ක්‍රමයේ ඇති අවාසි මොනවාද?

(ලකුණු 04)

(ආ) "සමහර භාණ්ඩයන්ට අදාල ඉල්ලුම් වක්‍රය, ඉල්ලුම් න්‍යායට ප්‍රතිවිරුද්ධව පිහිටයි." ඔබ එකග වේද? උදාහරණයක් සමග විස්තර කරන්න

(ලකුණු 06)

(ඇ) ඉල්ලුම් සහ සැපයුම් විශ්ලේෂණය භාවිතා කරමින් පහත දී තිබෙන තත්වයන් යටතේ වෙළඳ පළෙහි සිදු විය හැකි වෙනස්කම් විස්තර කරන්න. රූපසටහන් භාවිතා කරන්න.

i පුද්ගලයන් වැඩි වැඩියෙන් කෙසෙල් වගාවට යොමුවීම. කෙසෙල් සඳහා වෙළඳ පළ තත්වය

ii රජය විසින් වී ගොවියන්ට සහනාධාරයක් සැපයීම. වී සඳහා වෙළඳපළ තත්වය

iii බටර් මිල වැඩිවීමක් සිදුවිය. මාගරින් සඳහා වෙළඳපළ තත්වය

vi විදුලි මිල විශාල වශයෙන් වැඩිවිය. විදුලි උදුන් සඳහා වෙළඳපළ තත්වය

v X භාණ්ඩය නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා වැඩි වශයෙන් කම්කරුවන් යොදාගනී. කම්කරු වැටුප් මෑතකදී වැඩිවීමක් සිදු විය. X භාණ්ඩය සඳහා වෙළඳපළ තත්වය

vi මාධ්‍ය විසින් මාංශ අනුභව කිරීමේදී සෞඛ්‍යයට වන අහිතකර බලපෑම් ගැන පුළුල් ආවරණයක් ලබා දුනි. මාංශ සඳහා වෙළඳපළ තත්වය.

(ලකුණු 15)

3. (අ) පූර්ණ තරගකාරී සහ ඒකාධිකාරී තරග වෙළඳපළවල් අතර සමානකම් සහ වෙනස්කම් මොනවාද?

(ලකුණු 08)

(ආ) වෙළඳපළ ව්‍යුහය සම්බන්ධයෙන් ඔබ ලබා ගත් දැනුම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ඔබට උපයෝගී වන්නේ කෙසේ දැයි උදාහරණ සමග විස්තර කරන්න.

(ලකුණු 17)

4. පහත කරුණු සම්බන්ධයෙන් වෙනස්කම් දක්වන්න.

i විෂය මූලික (Positive) හා වටිනාකම් මූලික (Normative) ආර්ථික විශ්ලේෂණය

ii ස්ථාවර සහ වැඩෙන ආවස්ථික පිරිවැය.

iii ආදායම් සහ ආදේශන ප්‍රතිවිපාක

iv සැපයුම් වක්‍රය දිගේ ගමන් කිරීම සහ සැපයුම් වක්‍රය විතැන්වීම

(ලකුණු 25)

## B කොටස - සංඛ්‍යානය

(5) (i) ලඝු $_a b = 3$ හා ලඝු $_a 64 = 2$ නම් "a" හි වටිනාකම සොයන්න.

(ii) $x^2 = y^2\sqrt{2vu}$ නම් v වල අගය සොයන්න.

(iii) සුළු කරන්න. $\dfrac{\lfloor n+1}{\lfloor (n+1)-n \;\; \lfloor n}$

(ලකුණු 25)

(6) පහත සමීකරණ විසඳන්න.

(i) $9x+5=2(8-x)$

(ii) $\dfrac{5x+4y}{20}=22$ සහ $\dfrac{4x+5y}{20}=23$

(iii) $96-24y+2y^2=12y-y^2$

(iv) දුරකථනයක වාර්ෂික පිරිවැය (C) = A+nk සමීකරණයෙන් දෙන අතර එහි "n" යනු දුරකථන ඇමතුම් සංඛ්‍යාව වන අතර "A" යනු වාර්ෂික ස්ථාවර ගාස්තුව වේ. මෙහි "k" යනු එක දුරකථන ඇමතුමකට අය කරනු ලබන ගාස්තුවයි. දුරකථන ඇමතුම් 1200 හා 1500 ක ගාස්තුව පිළිවෙලින් රු. 960/- හා රු.1050/- ක් වේ. "A" හා "k" වල අගයන් සොයන්න. දුරකථන ඇමතුම් 800 ලබා ගැනීමේ පිරිවැය කොපමණද?

(ලකුණු 25)

(7) පහත වගුවෙන් දැක්වෙන්නේ විවිධ කොලර් ප්‍රමාණයන්ගේ කමිසවල අලෙවිය පිළිබඳ දත්ත වේ.

| කොළරයේ ප්‍රමාණය (සෙමී) | 36 | 37 | 38 | 39 | 40 | 41 | 42 |
|---|---|---|---|---|---|---|---|
| විකුණූ කමිස ගණන | 5 | 7 | 17 | 27 | 26 | 12 | 6 |

(i) ඉහත දත්ත ඉදිරිපත් කිරීම සඳහා සුදුසු ප්‍රස්ථාරයක් ගොඩ නගන්න.

(ii) ඉහත දත්ත සඳහා මධ්‍යන්‍යය $(\bar{x})$, මධ්‍යස්ථය හා මාතය ගණනය කරන්න.

(iii) වඩාත්ම සුදුසු කේන්ද්‍රීක ප්‍රවණතා මිනුම කුමක්ද? හේතු දක්වන්න

(iv) ඉහත ව්‍යාප්තියේ සම්මත අපගමනය (SD) ගණනය කරන්න

(v) $(\bar{x}-SD)$ හා $(\bar{x}+SD)$ ගනනය කර මෙම පරාශයට ගැනෙන කමිස ප්‍රමාණයේ ප්‍රතිශතය ගනනය කරන්න.

(ලකුණු 25)

- හිමිකම් ඇවිරිණි -